**හම්බන්තොට ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**-------------------------**

**1 මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**--------------------------------**

2017වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 23 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හම්බන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**---------------------**

සමාලෝචිත වර්ෂය තුළ නිමකර තිබූ කර්මාන්ත 3 ක් සඳහා සහ වාහන අළුත්වැඩියා වියදමක් සඳහා එකතුව රු. 9,493,287 ක් වැඩියෙන් ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**
**---------------------------**

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උප ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 4,875,940 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**----------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්
--------------------

2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අය විය යුතුව පවතින රු. 710,956 ක් වූ හිඟ හිටි වෙළෙඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම් වල මුළු එකතුව රු. 49,166,406 ක් විය.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**
**----------------------------------------------------**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 107,857,802 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය සහ පරිපාලන) රීති | | |
| i. 2 රීතිය | 50,025 | නොසැලකිල්ල හෝ විෂමාචාරය නිසා සභාව වෙත ඌනතාවයක් හෝ පාඩුවක් ඇතිවුවහොත් ඒ පිළිබඳව වගකිවයුතු නිලධාරීන්ගෙන් එම ගාස්තු අය කර ගැනීම කළ යුතු වුවත්, සභාවේ වාහන 03 ක වාර්ෂික ආදායම් බලපත්‍ර ලබා ගැනීමේදී ගෙවූ දඩ මුදල් වගකිව යුතු අයගෙන් අයකරගෙන නොතිබුණි. |
| ii. 193 රීතිය | | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත හා සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂය යටතේ වන අතිරික්තයක් හෝ ඌනතාවයන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| i. මුදල් රෙගුලාසි 371(5) | 91,127 | 2010 සිට 2016 වර්ෂය දක්වා ලබාදී තිබුණු අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවා නොතිබුණි. |
| ii. මුදල් රෙගුලාසි 571(3) | 2,324,913 | තැන්පත් කර වසර 02 ක කාලයක් ඉක්මවූ තැන්පත් ශේෂ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**1.3.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා වැයකර තිබුණු රු. 36,770,800 ක ප්‍රාග්ධන වියදම් සහ රු. 137,319 ක් වූ විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික වියදම පියවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ගැනීමට 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 14(1) හා 14(2) හි දැක්වෙන විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 8,629,022 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 3,821,455 විය.

## 2.2 ආදායම් පරිපාලනය

------------------------

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 7,224,500 | 7,753,058 | 6,919,927 | 833,131 | 368,000 | 582,424 | 668,993 | 1,134,604 |
| ii කුලී | 5,157,100 | 6,332,943 | 6,257,893 | 75,050 | 4,819,000 | 1,408,910 | 1,426,870 | 23,083 |
| iii බලපත්‍ර ගාස්තු | 1,030,600 | 1,747,778 | 1,763,328 | 710,880 | 1,126,500 | 4,136,105 | 4,213,655 | 726,429 |
| iv වෙනත් ආදායම් | 6,916,100 | 9,610,153 | 4,932,870 | 22,120,460 | 6,966,000 | 10,969,313 | 9,652,805 | 17,443,177 |
| එකතුව | 20,328,300 | 25,443,932 | 19,874,018 | 23,739,521 | 13,279,500 | 17,096,752 | 15,962,323 | 19,327,293 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයට බිල්කළ ආදායම් රු. 25,443,932 ක් වූ අතර, ඉන් රු. 19,874,018 ක මුදලක් අයකර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට පැවති රු. 19,327,293 ක් වූ හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 23,739,521 ක් දක්වා වර්ධනය වී තිබුණි.

**2.2.3 වරිපනම්**

----------

සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු. 832,628 ක් වූ අතර, ඊට ඇතුළත් රු. 5,000 කට වැඩි ශේෂ සහිත බදු ඒකක 19 කින් අයවිය යුතු හිඟ ශේෂවල එකතුව රු. 253,911 ක් විය. හිඟ වරිපනම් බදු අය කරගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.4 කඩකුලී**

---------

සූරියවැව අඩි 100 මාර්ගයේ තිස්සපුර කඩකාමර බදු දීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 ජූලි සිට බදුදී තිබූ අඩි 100 පාරේ තිස්සපුර කඩ කාමර 12 කින් තක්සේරු කුලියක් අය නොකර කඩ කාමර 06 කින් මාසිකව රු. 250 බැගින් සහ ඉතිරි කඩ කාමර 06 න් මාසිකව රු. 300 බැගින් සභා තීරණයක් මත බදු මුදල් අයකර තිබුණි.

(ආ) දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/ 2010/01 දරන චක්‍රලේඛයේ 06 ඡේදය අනුව වසර 05 කට වරක් තක්සේරුගත බදු මුදල නව තක්සේරුවක් මගින් සංශෝධනය කළ යුතු වුවත්, ඒ පරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.5 බලපත්‍ර ගාස්තු**

----------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(2) වගන්තිය අනුව විවිධ වෘත්තීන් සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු පනවා අයකර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, නීතීඥ, වෛද්‍ය, නොතාරිස් හා රෙජිස්ටාර් වැනි වෘත්තීන් වලින් බලපත්‍ර ගාස්තු අය කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149, 150 සහ 152 වගන්ති ප්‍රකාර බලපත්‍ර ගාස්තු අය නොකිරීම නිසා 2017 දෙසැම්බර් 31 දිනට රු. 712,956 ක හිඟ බලපත්‍ර ගාස්තු පැවතුණි.

**2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 6,157,085 ක් හා මුද්දර ගාස්තු රු. 15,963,375 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාත්මක නොකළ කර්තව්‍යයන්

----------------------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් සහා අරමුදල් යටතේ ක්‍රියාත්මක කිරීමට රු. 1,535,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු කර්මාන්ත 06 ක් සහ ප්‍රාග්ධන ආධාර මගින් ක්‍රියාත්මක කිරීමට, රු. 16,298,050 ක් වූ ප්‍රතිපාදන අනුමත වී තිබුණු කර්මාන්ත 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

i. සමස්ථ බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ රැස් කිරීමේ සේවාවක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

ii. කොම්පෝස්ට් අංගනය සඳහා භාරකරුවකු හෝ මුරකරුවකු සේවයේ යොදවා නොතිබුණු අතර, දෛනික වැටුප් ලබන සේවකයින් 06 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

iii. ප්ලාස්ටික් බෝතල්, ප්ලාස්ටික් භාජන, ටින් යනාදිය ජලය එක් රැස් වන ආකාරයට අවිධිමත්ව කොම්පෝස්ට් අංගනය තුළ ගොඩගසා තිබුණු අතර, අංගනයේ කාණු පද්ධතිය පවා කසළවලින් වැසී තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

-----------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 05 කට අදාළව 05 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 05 කට අදාලව 08 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණු අතර, එය විධිමත් කර ගැනීමට සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2003 වර්ෂයේදී ස්ථාන මාරු වී ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතුව පවතින රු. 27,650 ක් වූ ආපදා හිඟ ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමනාකරණය

### 3.3.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

ට්‍රැක්ටර් රථ දෙකක් මාස 18 - 33 දක්වා කාලයක සිටද, ජෙනරේටරය වසර 08 ක සිටද, කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය වසර 02 ක සිටද නිෂ්කාර්යව පවතී.

### 3.3.2 වාහන උපයෝජනය

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව භාවිතා කරනු ලබන වාහන 10 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වාහන 05 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) අයවැය ලේඛනය මගින් වියදම් විෂයයන් 18 ක් සඳහා සලසා තිබූ එකතුව රු. 10,198,955 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) ආදායම් විෂයයන් තුනක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 6,450,970 ක් වූ අතර, එම අගයයන් සියයට 18 සිට සියයට 37 දක්වා අගය පරාසයක විය.

(ඇ) ප්‍රාග්ධන වියදම් විෂයෙහි අහිතකර විචලනය රු. 37,130,800 ක් වූ අතර, එම අගය සියයට 310 ක් විය.

### 4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

ප්‍රාදේශීය සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

### 4.3 අභ්‍යන්තර විගණනය

2014 පෙබරවාරි 14 දිනැති අංක දපප/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද, අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා පවත්වා තිබුණේ එක් කමිටු රැස්වීමක් පමණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|
| (අ) ගිණුම්කරණය | i. | ගිණුම් ශේෂ අඩුවෙන් හා වැඩියෙන් දක්වන ලද අවස්ථා පැවතීම. |
| | ii. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සහ උපයෝගී ලේඛනවල දැක්වුණු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |
| (ආ) ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | ii. | නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබීම. |
| | iii. | රැස්කර තිබුණු බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබීම. |
| (ඇ) වත්කම් | i. | සභාව විසින් භාවිතයට යොදා ගන්නා ඉඩම් වල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| | ii. | දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග නොගැනීම. |
| (ඈ) අයවැය පාලනය | i. | නිසි අධ්‍යනයකින් හා ඇගයීමකින් යුතුව ඇස්තමේන්තු සකස් කර නොතිබීම. |
| | ii. | අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කර නොතිබීම. |